www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් ආන්ඩුව එක්සත් ජනපද මැතිවරනය අවලංගු කිරීමට පියවර ගනී

## Bush administration takes steps to cancel us election

### සමාජවාද සමානතා පක්ෂයේ ප්‍රකාශය
### 2004 ජුලි 13

බුෂ් ආන්ඩුවේ නිලධාරින් 2004 මැතිවරනය කල්දැමීම පිනිස අවශ්‍ය විය හැකි නෛතික පියවර පිලිබඳ සවිස්තර විශ්ලේෂනයක් ඉල්ලා ඇත. මෙම ඉල්ලීමෙන් නියෝජනය වන්නේ, එක්සත් ජනපද ව්‍යවස්ථාව අවලංගු කොට, ප්‍රජාතන්ත්‍ර අයිතීන් අහෝසි කොට, මිලිටරිය හා පොලීසිය මත පදනම් වන ආඥාදායකත්වයක් ගොඩ නැගීමේ නිසැක තර්ජනයකි. මෙය වනාහි, හුදු, මැතිවරන පරාජයක් පිලිබඳව පමනක් නො ව එක්සත් ජනපදය තුල සමාජ හා දේශපාලන කලබැගෑනි පිපිරීමක් සම්බන්ධයෙන් ද භීතියට පත්ව සිටින, අතිශයින් ම අපකීර්තියට හා මහජන පිලිකුලට ලක්ව ඇති තන්ත්‍රයක් විසින් ගන්නා ලද මංමුලාසහගත පියවරකි.

මෙම ඉල්ලීම ප්‍රසිද්ධ කලේ ඉරිදා නිව්ස්වීක් සඟරාව යි. එහි වාර්තා කොට ඇති ආකාරයට ෆෙඩරල් ඒජන්සි තුනක් දැනට මත් මෙම කටයුත්තට එක් වී තිබේ. ඒවා නම්, මෙවන් පියවරක් ගැනීමේ හැකියාව මුලින් ම යෝජනා කල අලුත පිහිටුවූ මැතිවරන සහායක කොමිසම, කිසිදු, සාක්ෂ්‍යයකින් තොරව මැතිවරනයට සම්බන්ධිත ත්‍රස්තවාදී තර්ජන පිලිබඳව නැවත නැවතත් අනතුරු ඇඟවීම් නිකුත් කරමින් සිටින ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුව, සහ ස්වදේශ ආරක්ෂක ලේකම් ටොම් රිජ්ගේ ඉල්ලීම පරිදි දැන් නෛතික හා ව්‍යවස්ථාමය කරුනු පිලිබඳව අධ්‍යයනයක යෙදී සිටින අධිකරන දෙපාර්තමේන්තුවේ නීති උපදේශක කාර්යාලය යි.

මැතිවරන සහායක කොමිසමේ සභාපති ඩිෆොරස්ට් සෝරීස්, ජාතික මැතිවරනයක් කල් දැමීම පිනිස කිසි නෛතික හෝ ව්‍යවස්ථාමය විධිවිධානයක් නොමැති බව පෙන්වා දෙමින් සඳුදා කොංග්‍රස් මන්ත්‍රී මන්ඩල දෙකෙහි ම රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් නායකයන් වෙත ලිපියක් යැවී ය. "බරපතල ත්‍රස්තවාදී ප්‍රහාරයක් ඇති වුව හොත්, මැතිවරනයක් අවස්ථාවේ ඡන්ද විමසීම අත්හිටුවීම හෝ වෙනත් දිනකට කල් තැබීම සඳහා යොදා ගත හැකි පැහැදිලි ක්‍රියා දාමයක් පෙනෙන්ට නැත" යි ඔහු ලිවී ය.

ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වීමට ඇති හැකියාව හේතු කොට ගෙන මැතිවරනය කල් දැමීමේ සූදානමක් අවශ්‍යව ඇතැයි කෙරෙන කියා පෑම පට්ටපල් බොරුවක් බව කියා සිටින සමාජවාදී සමානතා පක්ෂය එය ප්‍රතික්ෂේප කරයි. ඉරාකයට එරෙහි නීති විරෝධී ආක්‍රමනය යුක්තියුක්ත කරනු පිනිස ත්‍රස්තවාදී තර්ජනය යොදා ගත්තේ යම් සේ ද, 2000 ජනාධිපතිවරනය සාර්ථකව කොල්ල කා බලයට පත් අවස්ථාවේ සිට ම බුෂ් ආන්ඩුවේ රහස් න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස පැවත ඇති ආන්තික ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර නීතියුක්ත කරනු සඳහා ද එය (ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වීමට ඇති හැකියාව) දැන් යොදා ගනු ලැබේ.

ඊනියා "ත්‍රස්තවාදී තර්ජනයක්" පිලිබඳව මේ ආන්ඩුව කරන කිසිදු, ප්‍රකාශයක මොන ම විශ්වසනීය භාවයක් වත් නැත. ඉරාකය සහ එහි ඊනියා "මහා ජනනාශක අවි" මගින් එල්ල වෙතැයි කියැවුනු ආරක්ෂක තර්ජනය ගැන ආන්ඩුව සැලසුම්සහගතව බොරු කියා ඇත යන කරුන, සෙනෙට් රහස් ඔත්තු සේවා කමිටුව පසුගිය සතියේ නිකුත් කල වාර්තාව මගින් අවිවාදිතව සනාථ වී ඇත. බුෂ් ආන්ඩුව සමන්විත වන්නේ - ජනාධිපතිගේ හා උප-ජනාධිපතිගේ සිට පහලට ම - සිය සාපරාධී දේශපාලනික හා මිලිටරි ක්‍රියාවන් යුක්තියුක්ත කරනු පිනිස ඕනෑ ම දෙයක් කිරීමට සූදානම් මංමුලාසහගත හා භයානක මිනිසුන්ගෙනි.

තව ද, බලය මත්තෙහි තමන්ට පවත්නා ග්‍රහනය රැක ගනු පිනිස ඕනෑ ම දෙයක් කිරීමට සූදානම් මංමුලාසහගත හා භයානක මිනිසුන්ගෙන් බුෂ් ආන්ඩුව සමන්විත වෙයි. නොවැම්බර් මැතිවරනයට පෙරාතුව ත්‍රස්තවාදී ප්‍රහාරයක තර්ජනය පවතින තාක් දුරට, එහි සැලසුම්කරුවන් හා එය ක්‍රියාවට දමන්නන් වීමට බොහෝ සෙයින් ඉඩ ඇත්තේ, එක්සත් ජනපදය තුල ක්‍රියාත්මක වන යම් රහස් අල් කයිඩා ශාඛාවකට වඩා බුෂ් ආන්ඩුවත් විවිධ පොලිස් හා රහස් ඔත්තු ඒජන්සිත් සමග සම්බන්ධකම් පවත්වන අන්ත දක්ෂිනාංශික ප්‍රකෝපකාරීන් ය.

ත්‍රස්තවාදී ප්‍රහාරයක් හමුවේ මැතිවරන කල් දැමීම හා අවලංගු කිරීම සඳහා අවශ්‍ය පදනම් සැකසීමෙහි

තමන් දැන් යෙදී සිටින බව එළිදරව් වීමට බුෂ් ආන්ඩුව ඉඩ සලස්වා ඇත යන කරුන මගින්, අඩු ම ගනනේ, එහි ආධාරකරුවන් අතර සිටින නව-ෆැසිස්ට්වාදී කොටස්වලට එවන් ප්‍රහාරයක් දියත් කිරීම සඳහා දේශපාලනික ගාමකයක් හා දිරි ගැන්වීමක් සම්පාදනය කෙරී ඇත. එලඹෙන ජාතික මැතිවරනයේ දී මෙම ආන්ඩුවේ පරාජයක් පිලිගැනීමට ඔවුන් සූදානම් නැත.

අල් කයිඩා සංවිධානයෙන් ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වීමේ හැකියාව පිලිගනු ලැබුව ද ජාතික මැතිවරනයක් කල් තැබීම පිනිස එය කිසි ආකාරයක යුක්තිකාරකයක් නො වේ. ජෝර්ජ් වොෂිංටන් ජනාධිපති තනතුරට තේරී පත් වූ දා පටන් මේ දක්වා වසර 216ක කාලය තුල එවැන්නකට පූර්වාදර්ශයක් පැවතී නැත. පලමු වන ලෝක යුද්ධය තුල, දෙවන ලෝක යුද්ධය තුල සහ ප්‍රාන්ත දූසිමක පමන ගැටුම් ඇවිලෙමින් පැවති සිවිල් යුද්ධ කාල පරිච්ඡේදය තුල පවා ජාතික මැතිවරන නිසි කලට පැවැත්වුනි. වොෂිංටන් ඩීසී අගනගරය බ්‍රිතාන්‍යයන් විසින් යටත් කර ගැනී ධවල මන්දිරය ගිනිබත් කෙරුනු 1812 යුද්ධය අවස්ථාවේ පවා මැතිවරන අත්හිටුවීමට ආන්ඩුව කටයුතු කලේ නැත.

ත්‍රස්තවාදී ප්‍රහාරයක් සිදු වුවත්, එය හේතු කොට ගෙන නොවැම්බර් මැතිවරනය කල් දැමීමක් අවශ්‍ය වී ඇත්තේ මන්ද යන වග සම්බන්ධයෙන් මොන යම් හෝ නිරවුල් පැහැදිලි කිරීමක් කෙරී නැත. ඒ වෙනුවට, දක්ෂිනාංශික යුදකාමී ආන්ඩුවක් බලයෙන් පහ කෙරුනු මෑත ස්පාඤ්ඤ මැතිවරනයට මැඩ්රිඩ් බෝම්බ පිපිරීම මගින් ඇති වූ බලපෑම සම්බන්ධයෙන් සඳහන් කෙරී ඇත. මෙම සඳහන් කිරීම් යටින් දිවෙන අප්‍රකාශිත එහෙත් පැහැදිලි පූර්වාවයවය නම්, මහජනතාව "වැරදි" ආකාරයට, එනම් ස්පාඤ්ඤයේ දී ඔවුන් කලාක් මෙන් ඡන්දය පාවිච්චි කල හැකි නිසා, ත්‍රස්තවාදී ප්‍රහාරයකින් අනතුරුව මැතිවරනය කල් තැබීම හෝ අවලංගු කිරීම කල යුතු බව යි.

## ඇමරිකානු සමාජයේ අභ්‍යන්තර සමාජ ප්‍රතිවිරෝධතා

නොවැම්බර් මැතිවරන කල් දැමීමක් සඳහා බුෂ් ආන්ඩුව ගෙන යන සූදානම මෙහෙයවන ගාමකය බාහිරව පෙලඹවුනු ත්‍රස්තවාදී ප්‍රහාරයක තර්ජනය නම් නො වේ. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි මෙම පෙර නො වූ තර්ජනය සඳහා සැබෑ හේතුව පවතින්නේ ඇමරිකානු සමාජයේ අභ්‍යන්තර සමාජ ගැටුම් හා ප්‍රතිවිරෝධතා තුල ය. ආන්ඩුව ජනාධිපතිවරනය අවලංගු කිරීම ගැන පැහැදිලිව ම සලකා බලමින් සිටීය යන කරුන මගින් අදහස් වන්නේ ඇමරිකානු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ සමස්ත රාමුව ම හුදු දේශපාලන සන්ධිස්ථානයක් කරා නො ව ඓතිහාසික අවුල් ජාලයක් කරා සේන්දු වී ඇති බව යි.

විසි වන සියවසේ ලේ වැකි ඉතිහාසය නිතර ම පෙන්නුම් කර ඇති පරිදි, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ සිට පොලිස්-මිලිටරි ආඥාදායකත්වයේ විවිධ රූපාකාරයන් දක්වා හා ෆැසිස්ට්වාදය දක්වා පවා පරිවර්තනය ආරම්භ වන්නේ, දෙන ලද සමාජයක් තුල පවත්නා සමාජ ප්‍රතිවිරෝධතා හා ගැටුම් සාම්ප්‍රදායික ව්‍යවස්ථාමය ව්‍යුහයේ රාමුව ඇතුලත තව දුරටත් විසඳා ගත නො හැකි මට්ටමට තියුනු වූ විට ය. එක්සත් ජනපදය තුල දැන් එවන් තත්වයක් පවතී. එහි සුපිරි ධනවත් ප්‍රභූ පැලැන්තියත් වැඩ කරන පුලුල් මහජනතාවත් අතර සමාජ අගාධය, වෙනත් කිසි දියුනු ධනපති රටකට වැඩි පුලුල් හා ගැඹුරු මට්ටමකට ලඟා වී ඇත.

මැතිවරන අවලංගු කිරීමේ තර්ජනය අවබෝධ කර ගත යුත්තේ, සාම්ප්‍රදායික ප්‍රජාතන්ත්‍ර නියමයන්ට එරෙහිව උත්සන්න කෙරුනු ප්‍රහාර මගින් ගුනාංගීකරනය වූ එක්සත් ජනපදයේ මෑත දේශපාලන ඉතිහාසයේ සන්දර්භය තුල ය. මෙම කාල පරිච්ඡේදයේ කේන්ද්‍රීය අංගයක් වී ඇත්තේ, මැතිවරන ක්‍රියා දාමය ම, රට තුල දී පුද්ගලික ධනය රැස් කර ගැනීමටත් ලෝක පරිමානව ඇමරිකානු මිලිටරි බලය පුලුල් කර ගැනීමටත් පවත්නා සියලු සීමාවන් ඉවත් කර ගැනීමේ සිය සැලසුම් වලකන ඉවසිය නො හැකි බාධාවක් ලෙස සලකන ෆැසිස්ට්-හිතැති කොටස් රිපබ්ලිකන් පක්ෂය අත්පත් කර ගැනීම යි. නිල වසයෙන් පිලිගැනෙන එක ම විරුද්ධත්වය නැගෙන්නේ ද ලාභ ගරන ක්‍රමය හා ධනපති ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට එක සේ කැප වී සිටින කේඩෑරි, දිරිබල සිඳුනු ඩිමොක්‍රැටික් පක්ෂයකින් වන තතු යටතේ පවා එවන් සැලසුම් ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියාවට දැමීම කල නො හැකි ය.

අන්ත දක්ෂිනාංශය, 1990 ගනන් මැද සිට, ක්ලින්ටන් පිලිබඳ ස්ටාර් පරීක්ෂනය හා එහි ප්‍රතිඵලයක් ලෙස ඉන් අනතුරුව ආ ඔහුට එරෙහි දෝෂාභියෝගය හා සෙනෙට් නඩු විභාගය හරහා, පලමුව ක්ලින්ටන් පාලනයට වල කපා එය බලයෙන් පහ කිරීමටත් පසුව ෆ්ලොරීඩා අර්බුදයේ දී ශ්‍රේෂ්ඨාධිකරනය මැදිහත් වීමෙන් කූලු ගැන්වුනු ක්‍රියා දාමයක් මගින් 2000 මැතිවරනය කොල්ල කෑම පිනිසත් ක්‍රමානුකූලව වැඩ කර තිබේ.

මෙම සන්තතිය දැන් 2004 මැතිවරන අත්හිටුවීමේ සැලසුම් පිලිබඳ විවෘත සාකච්ඡාවක මට්ටම කරා ලඟා වී ඇත. මෙහි අභිප්‍රාය සම්බන්ධයෙන් කිසිවකු වැරදි වැටහීමක් ඇති කර ගත යුතු නැත: එනම් 2004 මැතිවරනය කල් දැමීම මගින් අදහස් වන්නේ, මැතිවරන ම අවලංගු කොට අවිනිශ්චිත කාල පරිච්ඡේදයකට

ධවල මන්දිරයේ ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් පැලපදියම් කරවීම යි.

ක්‍රියා දාමයේ ප්‍රගමනය පැහැදිලි හා සිත් කා වදිනසුලු යඃ පලමුව, ඡන්දයෙන් තේරී පත් වූ ජනාධිපතිවරයකු පෙරලා දැමීම, පසුව, මහජන ඡන්දයෙන් පරාජයට පත් තේරී පත් නො වූ ජනාධිපතිවරයකු බලයේ පිහිටුවීම. දැන්, වොෂිංටන් බල කොල්ලයකට සම වන ක්‍රියාවක් හරහා ඕනෑ ම මැතිවරනයක් කල් තියා ම වලකා ලීමේ ප්‍රයත්නය යි.

2004 මැතිවරනය අවලංගු කිරීමේ තර්ජනය වනාහි, 2001 සැප්තැම්බර් 11 දා ත්‍රස්තවාදී ප්‍රහාරය කඩතුරාවක් ලෙස යොදා ගනිමින් බුෂ් ආන්ඩුව ක්‍රියාවට දමා ඇති සියලු ම මර්දනකාරී පිලිවෙත්වල කුලු ගැන්වීම යිඃ

එම පිලිවෙත් නම්, දේශප්‍රේමී පනත සම්මත කිරීම, ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටුවීම, උතුරුදිග අන දෙන මධ්‍යස්ථානය (ප්‍රථම වතාවට පිහිටුවූ, මහාද්වීපික එක්සත් ජනපදයේ සියලු හමුදාවන් පාලනය කරන කේන්ද්‍රීය මිලිටරි අන දෙන මධ්‍යස්ථානය) නිර්මානය කිරීම, එක්සත් ජනපද මිලිටරිය හා සීඅයිඒ සංවිධානය අත් අඩංගුවට ගත් සිරකරුවන් වෙනුවෙන් ලෝක පරිමාන රැඳවුම් කඳවුරු ජාලයක් නිර්මානය කිරීම, මෙම කඳවුරු තුල හා ඉරාකයේ මිලිටරි බන්ධනාගාර තුල සිරකරුවන් වධබන්ධනයට ලක් කිරීම, සහ දැන් බුෂ් පත් කල සිය ගනනකගෙන් පිරවී ඇති උසාවි මත දිගට ම පීඩනය යොදමින් සිවිල් අයිතිවාසිකම් උල්ලංඝනය කරන වඩා රුදුරු පිලිවෙත් අනුමත කරන ලෙස ඉල්ලා සිටීම.

මැතිවරන අත්හිටුවීම පිනිස අවශ්‍ය ව්‍යවස්ථාමය හා නෛතික විධිවිධාන සමාලෝචනය කිරීමෙහි දැන් යෙදී සිටින නීති උපදේශක කාර්යාලය (ඕඑල්සී) වනාහි, බුෂ් ආන්ඩුවේ "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" දී රඳවා ගන්නා සිරකරුවන් වධබන්ධනයන්ට ලක් කිරීම යුක්තියුක්ත කරමින් දෙවසරකට ඉහතදී පිටු 50ක ලියවිල්ලක් කෙටුම්පත් කල ඒජන්සිය යි. ජනාධිපති වරයාට "ප්‍රධාන අන දෙන නිලධාරියා" ලෙස අත්‍යවශ්‍යයෙන් ම යුද- කාලීන ආඥාදායක බලතල ඇතැයි ඕඑල්සීය ප්‍රකාශ කලේ ය. ඔහු නීතියට ඉහලින් සිටින අතර උසාවි මගින් හෝ කොංග්‍රසය සම්මත කරන නීති මගින් හෝ ඔහු පාලනය කල නො හැකි ය.

මෙම සූදානම් කිරීම් හුදු නෛතික විශ්ලේෂනයකට එහා යන බවට කිසි සැකයක් නැත. ෆෙඩරල් පොලිස් ඒජන්සි මාලාවක් යොදා ගෙන ඕනෑ ම අවස්ථාවකට කල් තියා සූදානම් වෙමින් ගෙන යන ක්‍රියාකාරී සැලසුම් ඉදිරියට යමින් තිබේ.

මාස දෙකකට ඉහත දී, ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඒකකයක් වන ෆෙඩරල් හදිසි කලමනාකරන ඒජන්සිය (එෆ්ඊඑම්ඒ) "ෆෝවර්ඩ් චැලෙන්ජ් '04" නම් වූ අභ්‍යාසයක් සිදු කලේ ය. එය වනාහි, වොෂිංටනයට එල්ල වන ත්‍රස්තවාදී ප්‍රහාරයකට ප්‍රතිචාර දක්වන ආකාරය මූර්තිමත් කරමින් රහසිගත ස්ථාන 100කට වැඩි සංඛ්‍යාවක සිදු කෙරුනු, ෆෙඩරල් භටයන් 4,000ක් බලමුලු ගැන්වුනු අභ්‍යාසයකි. එෆ්ඊඑම්ඒය යනු දිගු කලක් තිස්සේ එක්සත් ජනපදය තුල මහා පරිමාන අභ්‍යන්තර මර්දන ක්‍රියා සඳහා සූදානම් කටයුතුවල යෙදෙන ප්‍රධාන ඒජන්සිය යි. එහි එම කටයුතු, නිකරගුවාවට එරෙහි එක්සත් ජනපද යුද්ධයක දී මධ්‍යම ඇමරිකානු සංක්‍රමනිකයන් හා යුද විරෝධී ක්‍රියාකාරීන් ලක්ෂ ගනනින් අත් අඩංගුවට ගනු පිනිස සැකසූ, "ඔපරේෂන් රෙක්ස් '84" යන සංකේත නාමය දරූ රේගන් යුගයේ සැලසුම දක්වා ම අතීතයට දිවෙයි.

නිව්ස්වීක් ලිපිය, පැහැදිලිව ම, මැතිවරනය අවලංගු කිරීමක දී මහජනතාව හා මාධ්‍ය එයට කෙසේ ප්‍රතික්‍රියා කරනු ඇත්දැයි යන්න පරීක්ෂා කරනු පිනිස බුෂ් ආන්ඩුව හිතාමතා ම සිදු කල තොරතුරු කාන්දු කිරීමක ප්‍රතිඵලය යි. මෙම කෙටි වාර්තාවේ කර්තෘ වන මයිකල් ඉසිකොෆ් වනාහි, ක්ලින්ටන් සමග පැවති තමන්ගේ සබඳතා පිලිබඳ ලෙවින්ස්කිගේ කියුම් පටිගත කල ලින්ඩා ට්‍රිප් සහ ස්වාධීන නීති උපදේශක කෙනත් ස්ටාර්ගේ කාර්යාලය එකිනෙක සම්බන්ධ කරන අතරමැදියකු ලෙස සේවය කරමින් ලෙවින්ස්කි සිද්ධියේ දී මූලික ක්‍රියා කලාපයක් ඉටු කල අයෙකි.

අඩු ගනනේ එක් ප්‍රමුඛ රිපබ්ලිකන් කොංග්‍රස් සභිකයෙක් එනම් කැලිෆෝනියාවේ නියෝජිත මන්ත්‍රී ක්‍රිස්ටෝපර් කොක්ස්, මැතිවරනය කල් දැමීම හුදෙක් ම තාක්ෂනික ප්‍රශ්නයක් ලෙස සලකමින් පක්ෂපාතී ප්‍රතිචාරයක් දක්වා ඇත. ඉරිදා රාත්‍රියේ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වෙමින් ඔහු පෙන්වා දුන්නේ, නිව් යෝකයේ නිලධාරීන් 2001 සැප්තැම්බර් 11 දා පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රාථමික මැතිවරන අවලංගු කොට පසුව ඒවා යලි වෙනත් තැනක පැවැත්වූ බව යි.

"ෆෙඩරල් මැතිවරන සම්බන්ධයෙන් එසේ කිරීමේ අධිකාරය සහිත කිසිවෙක් නැත. මට නෛතික සටහනක් දෙන්න, අවශ්‍ය කුමක් ද යන්න මට පවසන්නැයි ලේකම් රිජ් අධිකරන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත්තේ එබැවිනි. අප කොංග්‍රස් මන්ඩලයට ගොස් පනතක් සම්මත කර ගත යුතු ද?"

ඩිමොක්‍රැටික් පක්ෂය සහ මාධ්‍ය මෙතෙක් දක්වා ඇති ප්‍රතිචාරය අතිශයින් ම අර්ථභාරී ය. වාර්තාවේ

වැදගත්කම මාධ්‍ය විසින් නො තකා හැර තිබේ. ප්‍රවෘත්ති ජාල වෙතින් ලද කෙටි වාර්තාවන්ට පුවත්පත් ආවරනය සීමා වී ඇති අතර, *නිව් යෝක් ටයිම්ස්* සහ *වොෂිංටන් පෝස්ට්* වැනි ප්‍රධාන පුවත්පත්වල එම වාර්තා පවා පල කර නැත. මෙම අත්‍යසාමාන්‍ය ඉල්ලීම, ඇති විය හැකි දරුනු ම තත්වයකට සූදානමින් කෙරෙන ආකාරගත සැලසුමක් - කිසිදු දේශපාලනික අර්ථභාරයක් නැති නිලධරවාදී අභ්‍යාසයක් - ලෙස සලකමින්, රූපවාහිනි ප්‍රවෘත්ති ආවරනය නො සැලකිලිමත් ස්වරූපයක් ගෙන ඇත.

සීඑන්එන් රූපවාහිනිය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී, බුෂ්ගේ ජාතික ආරක්ෂක උපදේශිකා කොන්ඩලීසා රයිස් *නිව්ස්වීක්* වාර්තාව ගැන ඇගෙන් විමසූ වැඩසටහනේ නිවේදක වොල්ෆ් බ්ලිට්සර් සමග වාග් හුවමාරුවක යෙදුනු අතර, එය කලින් සූදානම් කෙරුනු දෙබසක් සේ පෙනී ගියේ ය. බුෂ් ආන්ඩුවට නොවැම්බර් මැතිවරනය අත්හිටුවීමේ "අභිප්‍රායක් නැති" බව රයිස් ප්‍රකාශ කිරීමෙන් පසුව බ්ලිට්සර් වෙනත් විෂයන්ට මාරු විය.

කෙරී-එඩ්වර්ඩ් මැතිවරන ව්‍යාපාරය, සැබෑ හෝ මවන ලද ත්‍රස්තවාදී "සිද්ධියක්" හේතු කොට ගෙන තම මැතිවරන ප්‍රයත්නයන් අවිනිශ්චිත තත්වයකට පත් විය හැකි ය යන යෝජනාවට කිසිදු නිල ප්‍රතිචාරයක් දක්වා නැත. වාර්තා වී ඇති පරිදි, ඒ ගැන යම් අදහසක් දැක්වීමට "කල් වැඩි" ය යි කෙරී පවසා ඇත.

මූලික ඩිමොක්‍රැටික් කොංග්‍රස් සභිකයන් ද කර ඇත්තේ අඩු ලංසුවේ අදහස් දැක්වීම් ය. නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ ස්වදේශ ආරක්ෂක කමිටුවේ සාමාජික, මැසචුසෙට්ස් ප්‍රාන්තයේ නියෝජිත මන්ත්‍රී එඩ්වර්ඩ් මාකි පැවසුවේ, පූර්ව-මැතිවරන ත්‍රස්තවාදී ප්‍රහාරයක් වලකා ලීම වඩාත් හොඳ වන අතර ම එවන් සිද්ධියක් සැලසුම් කිරීම ප්‍රතිවිපාක ගෙන එනු ඇති බව යි.

*ගෝර්ට එදිරි බුෂ්* නඩු විභාගයේ දී ශ්‍රේෂ්ඨාධිකරනය ගත් තීන්දුවට ඩිමොක්‍රැටික් පක්ෂය යටත් වීමෙන් පසුව 2000 දෙසැම්බරයේ දී සමාජවාදී සමානතා පක්ෂය කල අනතුරු ඇඟවීම ඉහත ප්‍රතිචාරයන් මගින් සනාථ වේ: එනම්, පාලක ප්‍රභූව තුල ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂාව සඳහා කිසිදු අර්ථභාරී ආධාරක පදනමක් නො පවත්නා බව යි. පාලක ප්‍රභූව ප්‍රජාතන්ත්‍රවාදය දකින්නේ සිය ධනයට හා වරප්‍රසාදවලට එරෙහි තර්ජනයක් ලෙස ය.

මීට යන්තම් මාස දෙකකට ඉහත දී, 2004 මැතිවරන ක්‍රියා දාමය තුල ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රකෝපකරනයක් හට ගැනීමේ තර්ජනය පිලිබඳව සසපය සාකච්ඡා කලේ ය. "2004 එක්සත් ජනපද මැතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයට සහයෝගය දෙන්න" යන මැයෙන් 2004 අප්‍රේල් 28 දා පල වූ අපගේ මැතිවරන නිවේදනයෙන් අපි මෙසේ අනතුරු ඇඟවීමු:

"සිය ස්වයං-ප්‍රකාශිත 'යුද ජනාධිපති' භූමිකාව මත තම දේශපාලන පැවැත්ම පරදුවට තැබීමට බුෂ් ගෙන ඇති තීන්දුව ඇමරිකානු මහජනතාව සම්බන්ධයෙන් අතිශය බියකරු ඇඟවුම් දරා සිටියි. මහජනතාවගේ මනෝගතිය කුමක් වුවත්, බුෂ් ආන්ඩුව සිය කැමැත්තෙන් බලය අත් හරිතැයි යනුවෙන් උපකල්පනය කිරීමට කිසිදු හේතුවක් නැත. විශේෂයෙන් ම බුෂ්ගේ මැතිවරන බලාපොරොත්තු වඩා නරක අතට හැරුන හොත්, 2004 මැතිවරන ව්‍යාපාරය දිග හැරෙද්දී වත්මන් පාලනය එක්සත් ජනපදය තුල නව හා ව්‍යසනකාරී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ඉඩ දීමේ නැත හොත් එවැන්නක් සැලසුම් කිරීමේ පවා සැබෑ තර්ජනයක් පවතී. එවන් ප්‍රහාරයක් හට ගත් අවස්ථාවක දී, නොවැම්බර් 2 දා මැතිවරනය කල් දැමීමට හෝ මුලුමනින් ම අවලංගු කිරීමට හෝ යුද නීති කොන්දේසි යටතේ පැවැත්වීමට හෝ ඉඩ ඇතැයි යන්න එක්සත් ජනපද මාධ්‍ය මගින් දැනට මත් අඟවනු ලැබ ඇත."

මේ අවස්ථාවේ උදාසීනත්වය තරම් භයානක දෙයක් තවත් නැත. මැතිවරනයක් කල් දැමීම - එනම්, එය අවලංගු කිරීම - තාක්ෂනික ගැටලුවක් නො වේ. සීසර් රුබිකන් ගංගාව තරනය කිරීම රෝමානු සමූහාන්ඩුවට අර්ථභාරී වූයේ යම් සේ ද, මැතිවරනය කල් දැමීමක් ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ ඉරනම සම්බන්ධයෙන් එලෙස ම අර්ථභාරී වනු ඇත. එමගින් නියෝජනය වනු ඇත්තේ ආපසු නො හැරෙන පියවරකි, ප්‍රජාතන්ත්‍රවාදී නියමයන්ගෙන් හා ව්‍යවස්ථාමය නෛතික තත්වයෙන් තීරනාත්මකව බිඳීමක - එනම්, පොලිස්-රාජ්‍ය ආඥාදායකත්වයේ හා සිවිල් යුද්ධයේ විධික්‍රම කරා හැරී ගැනීම යි.

දැවැන්ත ම අනතුර පවතින්නේ කම්කරු පන්තියේ දේශපාලනික නො දැනුවත් භාවය හා නුසූදානම තුල ය. කම්කරු පන්තිය දේශපාලනිකව ස්වාධීන බලවේගයක් ලෙස සංවිධානය කිරීමට ගෙන යන සටන හරහා මෙය ජය ගත යුතු ය. අත්‍යවශ්‍ය කටයුත්ත නම්, සංගත හා මූල්‍ය කුවේර තන්ත්‍රයේ පක්ෂ වන ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවලට සැබෑ දේශපාලන විකල්පයක් නිර්මානය කිරීම යි. 2004 මැතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂය ගෙන යන දේශපාලන උද්ඝෝෂනයේ අර්ථභාරය පවතින්නේ මෙය තුල ය.

© www.wsws.org